මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්" අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 3.1 ඡේදයෙහි සඳහන් පරිදි නව සිගාස් (CIGAS) වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබා ගත් SA-13, SA-31, SA-71, SA-72, SA-11-1 සහ SA-51-1 යන අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබිය යුතු වුවද එම අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණනයට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමග වූ මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA-82) කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි සහ ව්‍යුහයන් (9160) අයිතමයෙහි 2025 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.91,253,647 ක් වූ අතර එම වාර්තාවේම 2024 දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය රු.111,542,085 ක් වූයෙන්, රු.20,288,438 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව විගණනයට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමග වූ මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA-82) හා මූල්‍ය නොවන වත්කම් සාරාංශ වාර්තාවේ (SA-80) අනෙකුත් යන්ත්‍ර සහ උපකරණවල (9152) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එකතු කිරීම් අගය පිළිවෙළින් රු.123,521,950 ක් හා රු.124,709,999 ක් සහ අඩු කිරීම් පිළිවෙළින් රු.950,652 ක් හා රු.2,138,701 ක් විය. ඒ අනුව මෙම වාර්තාවල එකතු කිරීම් හා අඩු කිරීම් වටිනාකම අතර රු.1,188,049 ක බැගින් වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.161,290,262 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම සඳහා වන වියදම රු.416,317,932 ක් විය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණවල වර්ෂයේ මිලදී ගැනීම්වල වටිනාකම රු.181,625,200 ක් වූයෙන් එකී ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ පිරිවැය අතර නොසැසඳීම් පැවතුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් සතු තක්සේරු වටිනාකම රු.106,661,112 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණු අතර පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගිණුම්ගත කර තිබූ පිරිවැය රු.61,893,664 ක ස්ථාවර වත්කම සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් සතු රු.84,484,898 ක් වටිනා සේවා පියස් ගොඩනැගිලි 30 ක් ද, පානදුර හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු දළ වටිනාකම රු.333,992,000 ක් වටිනා ගොඩනැගිලි 04 ක් හා කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු රු.10,600,000 ක් වටිනා ඉඩම් කැබලි 02 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් සතු බදු ඉඩම් කැබලි 226 ක් ද, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.5,200,250 ක් වටිනා බදු ඉඩම් හා ගොඩනැගිලි 172 ක් ද, තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අතෙකුත් යන්ත්‍ර හා උපකරණ (9152) යටතේ දක්වා තිබූ මිලදී ගැනීම් වටිනාකම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යල 14 විසින් විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව එම වත්කම් මිලදී ගැනීම් වටිනාකම පිළිවෙලින් රු.29,687,167 හා රු.25,321,461 ක් විය. ඒ අනුව යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම් වටිනාකම අතර රු.4,365,706 ක වෙනසක් පැවතුණි.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.8 ඡේදයෙහි සඳහන් පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ වන "මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම" යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වත්කම් අත්පත් කර ගැනීමට දරන වියදම් පමණක් ඇතුළත් කළ යුතු වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට (ඒසීඒ - 6) අනුව 2025 වර්ෂයට අදාළව එකතුව රු.181,625,201 ක් වූ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් උක්ත ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) උක්ත රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේදයෙහි සඳහන් පරිදි, 7.8 ඡේදයෙහි සඳහන් වියදම් හැර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු

කිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ දැක්විය යුතු වුවද, ඒසීඒ - 2 (i) වැඩසටහනේ වියදම් ප්‍රකාශනය අනුව එකතුව රු.207,349,501 ක් වූ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් ද, රු.2,060,080 ක් වූ හැකියා වර්ධන වියදම් හා රු.45,618,088 ක් වූ වෙනත් මූලධන වියදම් උක්ත ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතට ඇතුළත් කර නොතිබුණි.

### 1.6.4 මූලධන වියදම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 06 ඡේදයෙහි සඳහන් පරිදි 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිතා කළ යුතු ආදර්ශ ආකෘති අනුව ඒ.සී.ඒ - 2 (i), ඒසීඒ - 2 (ii) සහ ඒසීඒ - 2 (iii) ආකෘතිවලට අදාළව වැය විෂය අංක 2509 වෙනත් මූලධන වියදම් යටතේ දැක්විය යුතු වුවත්, 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ ඒ.සී.ඒ - 2(i), ඒසීඒ - 2(ii) සහ ඒසීඒ - 2(iii) ආකෘතිවල වැය විෂය අංක 2509 මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ දක්වා තිබුණි.

(ආ) උක්ත රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.6 ඡේදයෙහි සඳහන් පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ( ඒසීඒ - එෆ්) "සංශෝධිත අයවැය ප්‍රතිපාදන" තීරුවට වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලට මු.රෙ. 66 හා 69 මාරුකිරීම් හා පරිපූරක ප්‍රතිපාදන ගැලපීමෙන් පසු අගය යොදා ගත යුතු වුවද, වෙනත් මූලධන වියදම්වලට අදාළව රු.47,000,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදන අගය උක්ත ඡේදය ප්‍රකාරව සඳහන් කර නොතිබුණි.

(ඇ) වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය (ඒසීඒ - 2 (i)) යටතේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල එකතුව රු.161,290,262 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ - 6) අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල එකතුව රු.181,625,201 ක් විය. ඒ අනුව මෙම මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම් අතර රු.20,334,939 ක නොසැසඳුනු වෙනසක් පැවතුණි.

### 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග වූ මූල්‍ය නොවන වත්කම් සාරාංශ වාර්තාවේ (SA – 80 හි) කෙරීගෙන යන වැඩ වැය විෂය යටතේ (9160-257) 2025  නොවැම්බර් දක්වා සටහන් කර තිබුණු රු.2,599,528 ක ඉවත් කිරීම (බැර ශේෂය) සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් යටතේ වූ කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි සහ ව්‍යුහයන් (9180) අයිතමයෙහි අවසන් ශේෂය සහ 2025 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව (SA- 82) එම අයිතමයෙහි ආරම්භක ශේෂය සමඟ සැසඳීමේ දී රු.20,288,438 ක වෙනසක් නිරීක්ෂණය විය. | 1.6.2.1(අ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 4.3 | සිදුවූ හානියේ වටිනාකම වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් නොපමාව අයකරගෙන පද්ධතිය ස්ථාවරව යථාවත්කිරීමට කටයුතු කල යුතුය. | 4.5(අ) |
| 4.1.3 (අ). | කොන්ත්‍රාත්තුව ඉවත්කිරීම සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගතයුතුය. | 4.7 (ආ) (i)(ii) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ විසර්ජන පනතින්, පරිපූරක ඇස්තමේන්තු මගින් සහ මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම මගින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 25 ක් සහ මූලධන වැය විෂයයන් 06 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු.559,763,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.158,046,213 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 සිට සියයට 71 දක්වා පරාසයක පැවතුණි. වැය විෂයයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ රු.3,680,000 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණ ද, එසේ ලබාගත් ප්‍රතිපාදන ද වර්ෂය අවසාන වනවිටත් උපයෝජනය නොකිරීම මත ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 6 සිට සියයට 10 දක්වා ඉතිරිව පැවතුණි.

### 3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2026 ජනවාරි හා පෙබරවාරි මාසයන්හි ගෙවීම් වවුචර් පරීක්ෂාවට අනුව 2025 වර්ෂය වෙනුවෙන් වැය විෂයයන් 06 ක් සඳහා රු.237,621 ක බැරකම් පැවතිය ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර තිබුණු බැරකම් පිළිබඳ ප්‍රකාශයේ එම බැරකම් පිළිබඳ දක්වා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් රු.237,621 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

"දිට්වා" සුළි කුණාටු තත්ත්වයෙන් බලපෑමට ලක් වූ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා 2025 නොවැම්බර් 28 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ (103) වැය ශීර්ෂය යටතේ කඩිනම් සහන සඳහා රු.5,429,600 ක ප්‍රතිපාදනයක් හා නිවාස හානි හා පදංචි නිවාස පිරිසිදු කිරීම සඳහා රු.50,325,000 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා වියදම් දරා තිබූ අතර, ඉතිරි වූ ප්‍රතිපාදන පිළිවෙලින් රු.2,474,106 ක් හා රු.1,362,384 ක මුදලක් නැවත 2025 දෙසැම්බර් 31 දින ආරක්ෂක අමාත්‍යාංශය මගින් පවරා ගෙන තිබුණි.

### 3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන | |
| (i) XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය | මාස 06 ත් වසර 01 ත් අතර කාලයකට පෙර මිය ගිය නිලධාරීන් 02 දෙනෙකුට අදාළ එකතුව රු.589,165 ක ණය ශේෂයක් අදාළ විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාවේ දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. |
| (ii) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | සනතුර හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.563,154 ක ණය ශේෂ මෙම වාර්තාවේ දින වන විටත් විධිවිධාන ප්‍රකාරව අය කර ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 (4) | කිසියම් හානියක් සිදු වූ දින සිට තුන් මසක් ඇතුළත ඒ පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වුවද, කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයකට, බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් |

| | |
|---|---|
| | කැබ රථයකට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ රථයකට සමාලෝචිත වර්ෂය තුළ සිදුවී තිබූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 880 | රජයේ නිලධාරීන්ගෙන් ඇප අය කිරීම සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ 2022 මාර්තු 16 දිනැති අංක 04/2022 දරන චක්‍රලේඛයෙහි 04 ඡේදයට අනුව වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇප තැබිය යුතු නිලධාරීන් 06 දෙනෙකු උක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2019 මැයි 31 දිනැති අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පානදුර, මිල්ලනිය, දොඩන්ගොඩ පාලින්දනුවර, වලල්ලාවිට හා මදුරාවල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 හි විශ්‍රාම වැටුප් ලිපි ගොනු 31 ක් 2025 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණි. |

### 3.6 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 හි සදහන් විධිවිධානවලට අනුකූලව, අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත්, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2025 වර්ෂය තුළදී අවස්ථා 06 ක දී විවිධ කාර්යයන් වෙනුවෙන් ලබා දී තිබූ අත්තිකාරම් මුදල්, එම කාර්යයන් අවසන් කර දින 10 ක් තුළ නැවත පියවා නොතිබුණි.

### 3.7 තැන්පතු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පතු ගිණුම් 06 ක එකතු ශේෂය රු.397,848,837 ක් වූ අතර, එකී ශේෂය තුළ පොදු තැන්පත් ගිණුම් 5 කට අදාළව වසර 02 ක් ඉක්ම වූ සහ වසර 05 ක් ඉක්ම වූ නිරවුල් කර නොතිබූ පිළිවෙළින් එකතුව රු.8,442,134 ක හා රු.5,257,310 ක් වූ තැන්පතු ශේෂ පැවතුණි.

(ආ) තවද, සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති ඉඩම් සඳහා වන්දි තැන්පත් ගිණුමේ ශේෂය රු.246,264,214 ක් වූ අතර එහි වසර 05 ක් ඉක්ම වූ නිරවුල් නොකළ රු.43,016,537 ක තැන්පතු ශේෂයක් ද පැවතුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් සියල්ල ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් යටතට ගැනෙන ක්ෂේත්‍ර/අංශ 15 ක පමණ කටයුතු පිළිබඳ සැලසුම් හා අපේක්ෂිත ඉලක්කයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම තුළ ඉදිරිපත් කර තිබුණු ඇතැම් අංශවල ප්‍රධාන කාර්යසාධන දර්ශක දක්වා තිබුණ ද එය සංඛ්‍යාත්මකව මැනිය හැකි අගයක් ලෙස නිශ්චිතව දක්වා නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම, මෙහෙවර හා අරමුණු ඉටුවන ආකාරයට ආයතනයේ ප්‍රධාන කාර්යයන් සකස් විය යුතු අතර, ඊට අනුගත වන ලෙස වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කළ යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළු අරමුණු හා කාර්යයන්වලට අනුගත වන ලෙස 2025 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අදාලව විගණනයට ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තා අනුව පාලන සහ ක්‍රමසම්පාදන යන අංශවල පිළිවෙලින් වාර්ෂිකව ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් 13 ක් හා 28 ක් හඳුනාගෙන තිබුණද, එම කාර්යයන්ට අදාලව ළඟා කරගැනීමට අපේක්ෂිත ඉලක්කය හා ළඟා කරගත් ප්‍රගතිය සංඛ්‍යාත්මක දර්ශක වශයෙන් ඉදිරිපත් කර නොතිබුණි. අභ්‍යන්තර විගණන අංශය මඟින් 2025 වර්ෂය තුළදී කාර්යයන් 16 ක් ළඟා කර ගැනීමට අපේක්ෂා කර තිබූ අතර ඉන් කාර්යයන් 10 ක ප්‍රගතිය සියයට 17 සිට 85 දක්වා වූ අතර ඉඩම් හා විමර්ශන අංශය මඟින් 2025 වර්ෂය තුළදී ප්‍රධාන සහ අනු ලෙස කාර්යයන් 71 ක් ළඟා කර ගැනීමට අපේක්ෂා කර තිබූ නමුත් ඉන් කාර්යයන් 04 ක කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. තවද එහි කාර්යයන් 36 ක ප්‍රගතිය සියයට 3 සිට 93 දක්වා පරාසයක පැවතුණි.

### 4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 වර්ෂයේ දී "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන යටතේ බණ්ඩාරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 03 ක ක්‍රියාත්මක කර තිබූ ගම්මිරිස් ගම්මාන ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දී තිබූ රු.322,800 ක ප්‍රතිපාදනවලින් රු.229,660 ක් වැයකර ගම්මිරිස් පැළ 4500 ක් පමණක් බෙදාදී තිබුණු අතර, ඉතිරි ප්‍රතිපාදන රු.93,140 ක් ආපසු පවරා දී තිබුණි. ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබූ පැළ රෝපණය කිරීමෙන් පසු වගාවේ ඇති වූ ගැටලු සම්බන්ධව පසු විපරම කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ප්‍රතිලාභීන්ගේ මෙන්ම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණු අතර, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී ද ඇතැම් ප්‍රතිලාභීන් සම්බන්ධව අඩු ආදායම්ලාභී සංකල්පයට අනුගත වී කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේ කිම්මල් වගාව පිළිබඳ ජාතික වැඩ පිළිවෙල ක්‍රියාවට නැංවීමේදී වලල්ලාවිට හා මිල්ලනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් 05 දෙනෙකු වෙත රු.805,000 මුදලක් ලබා දී තිබුණ ද එසේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට දැඩි අවශ්‍යතාවය හා කැපවීම ඇති ප්‍රතිලාභීන් තෝරා නොගැනීම හා ප්‍රතිලාභ ලබා දීමෙන් පසු වගකිව යුතු නිලධාරීන්ගේ අධීක්ෂණය ප්‍රමාණවත්ව සිදු නොවීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන යටතේ මදුරාවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී රු.6,016,447 ක් වැය කර ක්‍රියාත්මක කර තිබූ කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානය 2025 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

(ඈ) එසේම "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ මණ්ඩගල කුරුඳු ගම්මාන ව්‍යාපෘතිය සඳහා නිස්සාරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා ප්‍රතිලාභීන් 60 දෙනෙකු වෙනුවෙන් කුරුඳු පැළ හා උපකරණ ලබාදීම වෙනුවෙන් රු.4,869,111 ක් ලබා දී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 02 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද නිෂ්පාදනය කර තිබූ කුරුඳු තෙල් ප්‍රමාණය බෝතල් 27 ක් පමණක් වී තිබූ අතර 2024 පෙබරවාරි 10 දිනෙන් පසු මධ්‍යස්ථානයේ නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණි.

### 4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,843,000 ක පිරිවැයක් දරා ඉදිකරන ලද ඊනතොට පාලමෙහි 2024 ඔක්තෝබර් 24 දින වැඩ නිම කර තිබුණ ද 2025 වර්ෂය අවසන් වනවිටත් පාලම දෙපස ඉවුරු පාලම් මට්ටමට ගොඩකර ප්‍රදේශයේ ජනතාවට ප්‍රවාහන පහසුව සලසා ගත හැකි තත්ත්වයට පත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බිම්මල් වගාව ව්‍යාප්ත කිරීම තුලින් ගෘහ ආර්ථික තත්ත්වයන් උසස් කිරීමේ මූලික අරමුණ සහිතව මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ප්‍රතිලාභීන් 05 දෙනෙකු සඳහා මුළු පිරිවැය රු.300,000 කින් යුත් බිම්මල් වගා උපකරණ බෙදා දී තිබුණ ද මෙම ප්‍රතිලාභීන් සියලු දෙනාම විවිධ හේතූන් මත බිම්මල් වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. මේ හේතුවෙන් ඒ සඳහා වැයකර තිබූ රජයේ අරමුදල් රු.300,000 ක් නිශ්ඵල වියදමක් බවට පත්වී තිබුණි.

### 4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් සංචාරක ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය කිරීම යටතේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාවල පරණ ඇල ආශ්‍රිතව පරිසර හිතකාමී සංචාරක බෝට්ටු සේවාවක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන ජැටි නිර්මාණය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම (වැසිකිළි ඉදිකිරීම) සඳහා පිළියෙල කළ සංචාරක සැලැස්මක් යටතේ රු.8,683,843 ක් වැයකර තිබුණි. ඒ අනුව මාවල අලුත් ඇල ආශ්‍රිත මාවල හන්දියේ හා ධීරානන්ද මාවතේ සංචාරක බෝට්ටු සේවයක් ආරම්භ කිරීම සඳහා වූ අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් කිසිවක් සම්පූර්ණ වී නොතිබිය දී ජැටි 02 ක් පමණක් ඉදිකිරීම 2024 දෙසැම්බර් 30 දින අවසන් කර තිබුණි. එසේ වුවද මාවල හන්දිය කොටසේ ජැටි ඉදිකර තිබූ ජලාශය මුළුමනින්ම ජලජ ශාකවලින් වැසී ගොස් තිබූ අතර, වාර්තාවේ දින දක්වා සැලසුම් කළ පරිදි බෝට්ටු සේවාවක් ආරම්භ කර නොතිබුණි.

(ආ) ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය දියුණුකර ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමේ අරමුණින් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් 2023 හා 2024 යන වර්ෂවල රු.1,535,000 ක් වැයකර කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක

ප්‍රතිලාභීන් 19 දෙනෙකු වෙත එළුවන් 57 දෙනෙකු ලබා දී එළු පාලන ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර හා ක්‍රියාත්මක කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු නිර්ණායකයන්ට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

### 4.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළුතර දිස්ත්‍රික්කයේ සිදු වූ ස්වභාවික ආපදාවලින් පූර්ණ හානියට පත් වූ සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කළ යුතු බවට හඳුනාගත් පවුල් සඳහා "නිවසට නිවසක් " සංකල්පය යටතේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා හඳුනාගත් ප්‍රතිලාභීන් 64 දෙනෙකු සඳහා වාරික මුදල් ලෙස රු.78,410,572 ක මුදලක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් දිනට තවදුරටත් ප්‍රතිලාභීන් 23 දෙනෙකු වෙනුවෙන් රු.3,546,167 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි. එසේම මෙම සංකල්පය යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වාරික මුදල් ගෙවා තිබූ ප්‍රතිලාභීන් 38 දෙනෙකු අතරින් 2022 වර්ෂයේදී රු.900,000 ක වාරික මුදලක් ගෙවා තිබූ ප්‍රතිලාභීන් දෙදෙනෙකු නිවාස ඉදිකිරීම අතහැර දමා තිබූ අතර, එලෙස ගෙවා තිබූ මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(ආ) අධි අවදානම් තත්ත්වය හේතුවෙන් ඉවත් කළ යුතු බවට හඳුනාගත් පවුල් සඳහා "නිවසට නිවසක් " සංකල්පය යටතේ මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2017 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා හඳුනාගෙන ප්‍රතිලාභ ගෙවා තිබූ ප්‍රතිලාභීන් 31 දෙනා අතුරින් ප්‍රතිලාභීන් 05 දෙනෙකු වෙත අවසන් වරට වාරික මුදල් ගෙවා තිබූ දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගිවිසුම්ගත පරිදි නිවාස ඉදිකිරීම් කටයුතු අවසන් නොවීම මත තවදුරටත් රු.1,275,000 ක මුදලක් ගෙවීමට ඉතිරිව පැවතුණි. එසේම නිවාස ඉදිකිරීම සඳහා රු.500,000 ක වාරික මුදල් ගෙවා තිබූ ප්‍රතිලාභියෙකු වෙත ලබාදුන් රජයේ ඉඩම වෙනත් අයෙකුට නැවත පදිංචි වීමට ලබාදී තිබූ බැවින් අදාල වැඩසටහනින් ඉවත්කර තිබූ අතර ඉඩමක් මිලදීගෙන නිවස ඉදිකිරීම යටතේ රු.600,000 ක වාරික මුදල් ලබාගත් ප්‍රතිලාභියෙකුද වැඩ සටහනින් ඉවත්වී ගොස් තිබුණ ද ඔවුන් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කර තිබූ නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා හඳුනාගෙන තිබූ ප්‍රතිලාභීන් 177 දෙනෙකු අතුරින් ප්‍රතිලාභීන් 56 දෙනෙකු වෙනුවෙන් එකතුව රු.52,490,000 ක මුදලක් ගෙවා තිබුණ ද එලෙස මුදල් ගෙවා ආසන්න වශයෙන් වසර 04 ත් වසර 08 ත් අතර කාලයක්

ගත වී තිබුණ ද, වැඩසටහන මඟින් අරමුණු කළ පරිදි මෙම ප්‍රතිලාභීන් නැවත පදිංචි කර නොතිබුණි.

(ඇ) 2016 අගෝස්තු 02 දිනැති අංක අමප/16/1388/721/013 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මඟින් රුපියල් මිලියන 180 ක ඇස්තමේන්තු අගයක් මත කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් ලබා දී තිබූ අනුමැතිය මත 2016 වර්ෂයේ සිට 2025 වර්ෂය අවසානය දක්වා වූ දස වසරක කාලය තුළ කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත ලංසු ප්‍රදානය කර ගිවිසුම්ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලංසු ප්‍රදානය කර තිබූ පළමු කොන්ත්‍රාත්කරුගේ පැවති දුර්වල කාර්යසාධනය මත රු.11,548,172 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තව දුරටත් වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතුව තිබූ අතර ව්‍යාපෘතියේ II අදියර යටතේ 2023 දෙසැම්බර් 14 දින රු.86,851,155 ක අගයකට දින 273 කින් වැඩ නිම කිරීමේ අපේක්ෂාවෙන් ලංසු ප්‍රදානය කර තිබූ තෙවන කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත් කාලය 2025 ඔක්තෝම්බර් 10 දින දක්වා අවස්ථා කිහිපයකදී දීර්ඝ කර තිබුණි.

(ii) කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් බිල්පත හා වැඩ නිම කිරීමේ සහතිකය නිකුත් කර නොතිබූ අතර බිල්පත් අංක 08 වෙනුවෙන් ගෙවිය යුතු රු.4,018,493 ක මුදල වාර්තාවේ දින දක්වා ගෙවා නොතිබුණි.

(iii) මෙම ව්‍යාපෘතියේ II හා III අදියරයන්ට අදාල ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2025 වර්ෂයේ ලබාදී තිබූ රු. මිලියන 164 ක මුදලින් සියයට 65 ක් හෙවත් රු.මිලියන 107 ක ප්‍රමාණයක් ව්‍යාපෘතියේ III අදියරේ වැඩ කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් ආපසු හරවා යවා තිබූ අතර රු.මිලියන 57 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(iv) එසේම මෙම ව්‍යාපෘතියේ III වන අදියරේ ඉදිකිරීම කටයුතු ආරම්භ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලබාගත යුතු අනුමැතිය වාර්තාවේ දින දක්වා ලබාගෙන නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය ආරම්භකර වසර 10 ක් ගතවී තිබුණ ද ව්‍යාපෘතිය නිමකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 154.5 ක වියදමක් දරා ඉදිකර ඇති ගොඩනැගිලි සංකීර්ණය මේ වන විට නිෂ්කාර්ය තත්ත්වයේ පැවතුණි.

### 4.1.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

2024 විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,000,000 ක අනුමත ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබූ බෝමුවල ශ්‍රී මුනීන්ද්‍රාරාම මහා විහාරයේ ශ්‍රී සෝමානන්ද දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා 2024 ඔක්තෝබර් මස ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම් ආයතනයක් වෙත ගෙවා තිබූ රු.1,977,360 ක මුදලට අදාළව ගොඩනැගිලි ද්‍රව්‍ය සියල්ල සමග සිමෙන්ති කොට්ට 230 ක් සැපයීමකින් තොරව රු.399,050 ක මුදලක් එම සැපයුම් ආයතනය වෙත රඳවා ගෙන තිබුණි. එසේම මෙම සිමෙන්ති ප්‍රමාණය ගබඩාවට ලැබී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොග පොතෙන් නිකුත් කළ බවට ව්‍යාජ සටහන් යොදා තිබූ අතර, වාර්තාවේ දින දක්වා දහම් පාසල් ගොඩනැගිල්ලේ වැඩ නිමකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉලක්ක ගත අරමුණු ළඟා කරගෙන නොතිබුණි.

## 4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

### 4.2.1 ප්‍රතිපාදන නැවත පවරා දීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැව්ලි කලාපය සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂය තුළදී වැව්ලි කලාප ආශ්‍රිතව ජීවත් වන වතු ජනතාව සඳහා පානීය ජලය සැපයීමේ ව්‍යාපෘති 03 ක් සඳහා රු.6,400,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, එම ව්‍යාපෘති නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන නැවත පවරා දීමට සිදු වී තිබුණි.

(ආ) 2024 වර්ෂයේ විමධ්‍යගත වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ව්‍යාපෘති 12 ක් සඳහා ලබා දී තිබූ රු.7,00,000 ක ප්‍රතිපාදන ද "සෞභාග්‍ය දශකය 2024 – 2033" දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 06 ක් වෙනුවෙන් ලබා දී තිබූ රු.21,075,000 ක ප්‍රතිපාදන හා පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ ව්‍යාපෘති 11 ක් වෙනුවෙන් ලබා දී තිබූ රු.10,000,000 ප්‍රතිපාදන ද වශයෙන් වූ එකතුව රු.31,775,000 ක ප්‍රතිපාදන එම ව්‍යාපෘති නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් නැවත පවරා දීමට සිදු වී  තිබුණි. මෙම ව්‍යාපෘති යෝජනා තෝරා ගැනීමේදී එකී ව්‍යාපෘති ක්‍රියාත්මක  කිරීමේ හැකියාව සම්බන්ධයෙන් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් වගකිව යුතු පාර්ශවයන් විසින් සිදු කර නොතිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

(ඇ) 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු යටතේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය තුළ සම්මන්ත්‍රණ ශාලාවක්, ලේඛනාගාරයක් හා ග්‍රාම නිලධාරී කාර්යාලයක් සහිත තෙමහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ පළමු අදියර සඳහා රු.25,000,000 ක් ද, ක්ෂේත්‍ර

නිලධාරීන් සඳහා ආපන ශාලාවක් සහිත දෙමහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.10,000,000 ක් ද වශයෙන් එකතුව රු.35,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ගොඩනැගිලි සැලැස්මට ලබා ගත යුතු අනුමැතීන් අදාළ ආයතනවලින් නියමිත කාලය තුළ දී නොලැබීම හේතුවෙන් ප්‍රතිපාදන නැවත පවරා දීමට සිදු වී තිබුණි.

(ඈ) වතු ප්‍රදේශවල ස්වභාවික ආපදා නිවාස වැඩසටහන - 2025 යටතේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මොහොමඩ්වත්ත නාය යාමේ අවදානමට ලක්ව ඇති පවුල් 12 ක් ඉන් ඉවත් කර වතු නිවාස 12 ක් ඉදිකිරීම සඳහා වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මගින් ලබා දී තිබූ රුපියල් මිලියන 16.8 ක ප්‍රතිපාදන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය නිර්ණායක සම්පූර්ණ කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් 2025 වර්ෂයේ දී යලි පවරාදීමට කටයුතු කර තිබුණි.

4.2.2 **"කඳුකර දශකය 2024 – 2033" දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කෘෂි බෝග වගාව සිදු කරනු ලබන ආරක්ෂිත ගෘහ සංඛ්‍යාව ඉහළ නැංවීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදනය ඉහළ නැංවීමේ මූලික අරමුණින් ආරක්ෂිත ගෘහ තුළ බෝග වගා ප්‍රවර්ධනය තුළින් කෘෂි ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා නයි මිරිස් වගාව සඳහා එක් ප්‍රතිලාභියෙකුට රු.618,420 ක් බැගින් ප්‍රතිලාභීන් 12 දෙනෙකු වෙත රු.7,421,040 ක මුදලක් ප්‍රතිලාභ ලෙස ලබා දී තිබුණි. එසේ වුවද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාමේ දී ඒ සඳහා සුදුසුකම්ලත් අධීක්ෂණ මට්ටමේ නිලධාරියෙකුගේ සම්බන්ධීකරණය හරහා ක්‍රියාත්මක නොවීම හා පරිසර සාධක සැලකිල්ලට ගෙන ආරක්ෂිත ගෘහ ස්ථාපිත නොකිරීම හේතුවෙන් මේ සඳහා තෝරාගෙන තිබූ ආරක්ෂිත ගෘහ ක්‍රමය පළිබෝධ හානි පැතිරීමට ආධාරකයක් වී තිබූ තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) (i) ආරක්ෂිත ගෘහ තුල බෝග වගා ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පොලිටනල් වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් රු.750,000 ක් රජය මගින් වැය කිරීමටත් ඉතිරි රු.250,000 ප්‍රතිලාභියාගේ දායකත්වය තුලින් එක් ආරක්ෂිත ගෘහයකට රු.1,014,865 කට පිළියෙල කර තිබූ ඇස්තමේන්තු මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් වූ යෝජනාව පසුව එක් ගෘහයකට ඇස්තමේන්තුව රු.604,420 දක්වා අඩු කර තිබුණි. එලෙස අඩු කර තිබූ ඇස්තමේන්තුව පදනම් කරගෙන කැඳවා තිබූ ලංසු සැලකිල්ලට ගෙන ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය අනුව ලියවන පට්ටල් වැඩ සහ ග්‍රිල් ගේට්ටු ඇතුළු වෙල්ඩින් වැඩ පමණක් ඉටුකරන නමුත් පොලිටනල් ආරක්ෂිත ගෘහ ඉදිකිරීම සම්බන්ධ පළපුරුද්දක් හෝ ප්‍රවීනත්වයක්

නොමැති කොන්ත්‍රාත්කරුවෙක් වෙත ලංසු ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්කරු ඉදිකර තිබූ එක් පොලිටනලයක් වෙනුවෙන් රු.603,550 ක මිලක් යටතේ පොලිටනල් 12 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.6,518,340 ක මුදලක් එම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගෙවීම කර තිබුණි.

(ii) මෙම පොලිටනල් අනුමත සැලසුම් හා පිරිවිතරවලට අනුකූලව ඉදිකිරීම කර තිබූ බවට කිසිදු කාර්මික හෝ තාක්ෂණ නිලධාරියෙකුගේ නිර්දේශයකින් තොරව ගෙවීම් කර තිබූ අතර, ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබූ ආරක්ෂිත ගෘහවල වහලයේ ඉටිකොළ ආවරණ වැසි ඇදහැලෙන අවස්ථාවල දී ගැලවී කඩා වැටීම, හා ආරක්ෂිත ගෘහ සම්බන්ධව තාක්ෂණික ගැටළු උද්ගත වීම හේතුවෙන් සැලසුම් කර තිබූ පරිදි ප්‍රතිලාභීන් හට වගා කටයුතු කර ගෙන යාමට නොහැකි වීම හේතුවෙන් උක්ත ව්‍යාපෘතියේ අරමුණු අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 4.3 ප්‍රසම්පාදන

සමාලෝචිත වර්ෂයේ දී මැදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් එනම්, ගිණුම් අංශයේ ඇළුමිනියම් දොරවල්, ජනෙල් සවිකිරීම හා කවුළු සැකසීම සඳහා වූ ව්‍යාපෘතියේදී මුළු පිරිවැය රු.3,400,000 ක් වූ ඇස්තමේන්තු 03 ක් වෙන් වෙන්ව සකසා ඒ සඳහා වෙන් වෙන්ව ප්‍රාදේශීය සමිති 02 ක් සමඟ ගිවිසුම්ගත වී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව රජයට උපරිම වාසි සැලසෙන පරිදි අවම පිරිවැයක් යටතේ වැඩි තරඟයක් ඇති වන ආකාරයට උපරිම විනිවිද භාවයකින් යුතුව උක්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විවෘත මිල ගණන් කැඳවනු වෙනුවට එකම කාර්යයක් සඳහා වන ඉහත ව්‍යාපෘතිය, එක් ව්‍යාපෘතියක් ලෙස සලකා ලංසු කැඳවීම වෙනුවට කොටස් 03 කට බෙදා ප්‍රජා සංවිධාන සඳහා කොන්ත්‍රාත් ලබාදීමේ උපරිම සීමාව වූ රු.මිලියන 02 ක සීමාව ඉක්මවා නොයන ලෙස ප්‍රජා සංවිධාන 02 ක් මඟින් මෙම ව්‍යාපෘතිය ඉටුකර ගැනීමට කටයුතු කර තිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) රුපියල් මිලියන 145 ක් වැයකර ඉදිකිරීම කටයුතු නිමකර 2016 වර්ෂයේ විවෘත කරන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආසන 850 කින් සමන්විත නව ශ්‍රවනාගාරයක් ස්ථාපිත කර තිබුණි. එම ශ්‍රවනාගාරය බාහිර ආයතනවලට ලබා දීමේදී දෛනික ගාස්තු වශයෙන් රු.150,000 ක මුදලක් අය කිරීම හේතුවෙන් වැඩ සටහන් සඳහා මෙම ශ්‍රවනාගාරය වෙන් කර ගැනීමේ නැඹුරුතාවයක් දක්නට නොලැබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශ්‍රවනාගාරය විවෘත කොට වසර 10 ක් ගත වී

තිබුණ ද උනෙ උපයෝජිත තත්ත්වය මග හැර ඵලදායී උපයෝජනයකට යොදා ගත හැකි පරිදි සුදුසු වැඩ පිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

(ii) ශ්‍රවනාගාරයේ වායු සමීකරණ පද්ධතිය මීයන් විසින් හානිකර තිබීම නිසා වායු සමීකරණයේ සිසිලස පිටතට කාන්දු වන තත්ත්වයක් මෙන්ම ශ්‍රවනාගාරයේ ඉදිරිපස වැහිපිලි පද්ධතිය යකඩ මලබැඳීම නිසා දිරාගොස් අබලන් වී කොටසක් කඩා වැටී තිබීම හා විදුලි පහන් අක්‍රිය වීම ආදී වශයෙන් වූ පිළිසකර කළ යුතු තත්ත්වයන් සඳහා රු.3,500,000 කට ආසන්න මුදලක් වැය වන බවට ඇස්තමේන්තු කර තිබුණි. ශ්‍රවනාගාරය නඩත්තු කර පවත්වාගත හැකි අයුරින් ප්‍රමාණවත් ආදායමක් රජයට ලැබෙන පරිදි සුදුසු වැඩපිළිවෙලක් සකසා නොතිබීම හේතුවෙන් ශ්‍රවනාගාරය නඩත්තු කිරීම වෙනුවෙන් තවදුරටත් මුදල් වැය බරක් දැරීමට සිදුවන බවට විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

**4.5** පාඩු හා හානි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහලේ ප්‍රධාන පිවිසුම අභියස ප්‍රධාන විදුලි පුවරුවෙහි 2024 වර්ෂයේ දී සිදුව තිබූ ගිනි ගැනීම හේතුවෙන් ගොඩනැගිල්ලට හා ප්‍රධාන විදුලි පුවරුව ආශ්‍රිත සමස්ථ විදුලි බල පද්ධතියට වූ හානියේ වටිනාකම රු.7,500,000 ක් බවට ඇසත්මේන්තු කර තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පිළියෙල කර තිබූ වාර්තාවට අනුව ඊට වගකිව යුතු පාර්ශවය වන ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙතින් එම හානිය ප්‍රතිපූර්ණය කර ගැනීමට වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ හටගත් ගිනි ගැනීම හේතුවෙන් හානියට පත් විදුලි සැපයුම කෙටි කාලයකට පමණක් යෝග්‍ය වන පරිදි ලබා දී තිබූ විදුලි සැපයුම ස්ථාවර විදුලි සැපයුමක් දක්වා යථාවත් කිරීමට වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. මෙම අභ්‍යන්තර විදුලි පද්ධතියේ පවතින මෙම අස්ථාවර තත්ත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදීම ගොඩනැගිල්ල හා ගොඩනැගිල්ල අවට හදිසි ගිනි ගැනීම තත්ත්වයන් හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු.649,607 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය හා භූමිය භාවිතයෙන් හෝ කිසිදු නඩත්තුවකින් තොරව දිගුකාලයක් පැවතීම හේතුවෙන් වහලය දිරාගොස් සම්පූර්ණයෙන්ම කඩා වැටී තිබූ අතර, සොරුන් විසින් ගොඩනැගිල්ලේ දොර ජනෙල් මෙන්ම ගොඩනැගිල්ලේ සියළුම විදුල පේනු, විදුලි පංකා, රෙගියුලේටර් ඇතුළු

විනාශ කර විදුලි පරිපථ පුවරු ද සම්පූර්ණයෙන්ම ගලවා ගෙන ගොස් තිබුණි. මෙ සම්බන්ධව පොලිසියට පැමිණිලි කිරීම හැර මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂාවක් සිදුකර වගකිවයුත්තන් නිශ්චය කර අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.6 අනාර්ථික ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දොඩන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලියාපදිංචි සමිති වෙත ලබාදීම සඳහා ප්ලාස්ටික් පුටු 885 ක් මිලට ගැනීම වෙනුවෙන් රු.1,681,550 ක මුදලක් වැයකර තිබූ අතර, මෙම උපකරණ බෙදාදීමේ දී ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති මෙන්ම ක්‍රියාකාරී සමිති වෙනුවෙන් පමණක් උපකරණ ලබාදිය යුතු වුවද ලියාපදිංචි හා ක්‍රියාකාරී බව තහවුරු කර ගැනීමෙන් තොරව මෙම ප්ලාස්ටික් පුටු ලබා දී තිබුණි.

(ආ) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2018 වර්ෂයේදී රු.1,796,403 ක් වැයකර දොඩන්ගොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ විවිධ ස්ථානවල ටයිල් ඇතිරීමේ කොන්ත්‍රාත්තුව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස නිමකර තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුව නිමකිරීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අවස්ථා කිහිපයක දී ටයිල් කැට පොළොවෙන් උඩට මතු වී ගැලවී ගොස් තිබූ අතර, ප්‍රධාන රැස්වීම් ශාලාවේ ටයිල් කැට 112 ක් පමණ ගැලවී ගොස් තිබුණි. මෙම තත්ත්වය මත ශාලාව භාවිතා කිරීම අපහසු තත්ත්වයට පත් වී තිබුණ ද නිසි ප්‍රමිතියෙන් කොන්ත්‍රාත්තුව නිම නොකළ ද කොන්ත්‍රාත්තුවේ රඳවුම් මුදල් 2021 මාර්තු 09 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

## 4.7 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතුව ඇති රු.3,634,307 ක් වූ සමුච්චිත ප්‍රමාද ගාස්තු මුදල 2025 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. එසේම මෙම කොන්ත්‍රාත්තුවේ සිදුකර තිබූ රු.8,358,049 ක් වූ අතිරේක වැඩ වටිනාකමට අදාළව 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව නිසි අනුමැතිය ලබාගෙන නොතිබූ අතර, ගිවිසුම් ප්‍රකාරව ඉටු නොකළ වැඩ කොටස් ද පැවතුණි.

(ii) තවද, ගොඩනැගිල්ලේ ඉදිකිරීම තත්ත්වය ප්‍රමිතියෙන් බැහැර වී තිබීම හා අවශ්‍ය අවස්ථාවන් හි දී ඉදිකිරීම පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණය සිදු නොකිරීම නිසා ඉදිකිරීම් දෝෂ 20 කට අධික සංඛ්‍යාවක් පැවති අතර, කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව

ඉටුකළ වැඩවල ඉදිකිරීම් දෝෂ නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරු කටයුතු කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත් ගිවිසුම දෙපාර්තමේන්තුවේම ඒකපාර්ශවයෙන් නීත්‍යානුකූලව අවසන් කිරීමට (Manual Termination) තීරණය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු 17 ක් යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණු අතර ඒ ඒ සංවර්ධන ක්‍රියාකාරකම්වල ජයග්‍රහණ දර්ශකවල අපේක්ෂිත ඉලක්කයන් හා වර්ෂයේ එම ඉලක්කයන් ළඟාකර ගැනීම සංඛ්‍යාත්මකව මැනිය හැකි නිශ්චිත දර්ශකයකත් (KPI) හඳුනාගෙන නොතිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය විගණනයට නිශ්චිතව මැනිය නොහැකි විය.

6 යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

කළුතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක ප්‍රාදේශීය ලේකම්වරු සඳහා පවත්වාගෙන යනු ලබන නිල නිවාසවල අදාල ප්‍රාදේශීය ලේකම් පදිංචිව නොසිටින අතර වෙනත් කිසිදු නිලධාරියෙකු හෝ පදිංචිව නොසිටීම හේතුවෙන් එම නිල නිවාස නිෂ්කාර්යව හෝ ඌණ උපයෝජිතව පැවතුණි.

07. අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 හි 2025 දෙසැම්බර් 31 දිනට තනතුරු 25 කට අදාළව පුරප්පාඩු 248 ක් ද තනතුරු 09 කට අදාළව අතිරික්ත කාර්ය මණ්ඩලය 54 ක් ද පැවතුණි. ඉහත පුරප්පාඩුවල ප්‍රධාන ඉංජිනේරු තනතුර 2025 අගෝස්තු 08 දින සිට ද දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් තනතුර 2025 ඔක්තෝබර් 09 දින සිට ද පුරප්පාඩු වී පැවතුණු අතර, මීට අමතරව සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 05 ක ද සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 06 ක ද පුරප්පාඩු පැවතුණි. ප්‍රධාන අභ්‍යන්තර විගණක හා ප්‍රධාන ඉංජිනේරු වැනි ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පැවතීම දිස්ත්‍රික් කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපා තිබෙනු විගණනයේදී නිරීක්ෂණය විය.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට